www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 9/11 පටන් පස් වසරක්: දේශපාලන ශේෂපත්‍රයක්

## Five years since 9/11: A political balance sheet
## Part one

### පලමු වන කොටස

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2006 සැප්තැම්බර් 11**

*පහත පලවන්නේ, එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත්, සැප්තැම්බර් 9-10 දෙදින තුල පවත්වනු ලැබූ පක්ෂයේ සාමාජික රැස්වීමට ඉදිරිපත් කල වාර්තාවේ පලමු වන කොටසයි.*

### 9/11 සිද්ධීන් පිලිබඳව දන්නා දේ

2001, සැප්තැම්බර් 11 සිදුවීම්වල පස්වන සංවත්සරය යෙදී ඇත්තේ ලබන සඳුදාට ය. එම උදෑසන, එකිනෙකට බැඳුනු ත්‍රස්තවාදී ක්‍රියාවල ප්‍රතිපල වසයෙන් අහිමි වූ අහිංසක සිවිල් වැසියන්ගේ මුලු ජීවිත ප්‍රමානය 2500 ඉක්මවයි. මහජන විඥානය මත ඒසා සංවේදී බලපෑමක් ඇති කල වෙනත් එකදු සිද්ධියක් මෑත ඉතිහාසයේ දැකීමට දුෂ්කරය. නමය ඉරක් එක එක යන සංකේතය ලොව වෙනත් කොතැනකට හෝ අදාලවන්නේ නැත. සර්ව ලෝකමය වසයෙන් එය පතල කරන්නේ නිවුන් කුලුනු වෙතින් බුරබුරා නැගෙන ඝන දුමාරයේ මනෝ රූපය පමනක් නොව, එදින හට ගත් දේහි ප්‍රතිඵලය වසයෙන් ලෝක දේශපාලනය, අලුත් හා අන්තරායකාරී දිශාවන්ට රැඩිකල්වාදීව නැඹුරුවීම පිලිබඳ සිතිවිල්ලයි.

කෙසේවුවද, බුෂ් පරිපාලනය, දේශපාලන සංස්ථාපිතය හා මාධ්‍යයේ වැඩි කොටසක්, සියලු දෙනාම විශ්වාසයට ගත යුතු යයි කියා සිටි දේට වැඩි සැබෑ වැදගත්කමක් 9/11 ට ඇත්තේ ය.

2001 සැප්තැම්බර් 11, ඇමරිකාවේ හා ලෝක දේශපාලනයේ යම් ආකාරයක ප්‍රධාන සන්ධිස්ථානයක් සලකුනු කිරීම පිලිබඳ ප්‍රශ්නයක් නැත. එහෙත්, රාජ්‍ය අනුග්‍රහය ලත් ප්‍රචාරනයෙන් විශාලකොට දක්වනු ලැබූ, එදින සිදුවීම්වල දෘෂ්‍යමාන හා ආවේගී බලපෑම, එක්සත් ජනපද ආන්ඩුව විසින් පසුව ගනු ලැබූ පියවරයන් අභිප්‍රේරනය කලා වූ ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගේ වෛෂයික ක්‍රියා කලාපය ද, අතර ප්‍රභේදනයක් අවශ්‍ය කෙරේ.

ප්‍රශ්නය 9/11 පසුව බුෂ් පරිපාලනය විසින් ගනු ලැබූ පියවර, බෙහෙවින්ම තීරනය වූයේ එදින සිදුවීම් විසින් ද? නොඑසේ නම්, කලකට පෙර වර්ධනය කල එහෙත්, 9/11 නොමැතිව සැලකියයුතු ජනතා සහයෝගයක් ලැබිය නොහැකි වනු ඇති ප්‍රතිශක්තීන් ක්‍රියාත්මක කිරීමට ත්‍රස්තවාදී ප්‍රහාරයන් නිමිත්ත සම්පාදනය කලේ ද ? යන්නයි.

ඇෆ්ගනිස්ථාන හා ඉරාක ආක්‍රමනය, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කරන ප්‍රහාරය, ජාත්‍යන්තර නීති උල්ලංඝනය කිරීම හා, බුෂ් පරිපාලනය, එහි අවසානයක් නැති "ත්‍රස්තයට එරෙහි යුද්ධයේ" කොටසක් ලෙස සැලසුම් කරන, එන්ට එන්ටම පුලුල් පරිමාවක් ගන්නා ප්‍රචන්ඩත්වය (බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව හා කැනඩාවේ ආන්ඩු විසින් වඩාත් ප්‍රකට ලෙස සම්බන්ධවූ) එහි සුජාතභාවය අත් කර ගත්තේ "9/11 සියල්ල වෙනස් කලේ ය" යන්න හැර වෙනත් තර්කයකට ඉඩක් නැති, බුෂ් පරිපාලනයේ ප්‍රකාශවලිනි.

එහෙත්, ලෝක ඉතිහාසයේ මේසා ඉරනම් සහගත වූ දිනයක් වන සැප්තැම්බර් 11, තව දුරටත් අනාවරනය නොවූ අභිරහසක්ව පවතියි. 9/11 සිදුවීම් තුලට ගමන්ගත් විශ්වාසකටයුතු, වෘත්තීයමය හා බැරෑරුම් යයි දුරින් හෝ සැලකිය හැකි පරීක්ෂනයක් ආන්ඩුවේ ආයතනයක් හෝ ආන්ඩුවේ අංශයක් විසින් කිසිවිටෙක පවත්වා නැත. ඊනියා 9/11 කොමිසම 1) එක්සත් ජනපද ඔත්තු සේවාවන්ට, 9/11 ත්‍රස්තවාදීන්ගේ සම්බන්ධය. 2) 9/11 කුමන්ත්‍රනය සාර්ථක කර ගැනීමට අනුබලය හා පහසුකම් සැපයීමට සම්බන්ධ, රජය තුල සිටින්නාවූ අයගේ පාර්ශ්වයෙන් පල වූ සාපරාධී උදාසීනත්වය, හෙලිදරව් කිරීමට අදාල සාක්ෂ්‍ය සොයා ගැනීම වැලැක්වීම හා සැබෑ අපරාධ පරීක්ෂනයකට අවහිර කිරීමේ අඩු හෝ වැඩි වසයෙන් පැහැදිලි අරමුන සහිතව සංවිධානය කල, නරුම හා බොරුකාර ව්‍යායාමයකට වැඩි දෙයක් නො වේ.

9/11 කොමිසමේ ප්‍රෝඩාකාරී ස්වභාවය, එහි සභාපති තෝමස් කීන්ගෙන් පටන් ගෙන අනෙකුත් ප්‍රමුඛයන් තෝරාගැනීමෙන් ම සහතික කෙරී තිබේ. නිව් ජර්සි හි හිටපු ආන්ඩුකාරයා ද, ඇම්වරාඩා හෙස් නම් ජාත්‍යන්තර තෙල් සමාගමේ අධ්‍යක්ෂ මන්ඩල සාමාජිකයෙකු ද වූ, ඔහු ගෙන් යමෙකු බලාපොරොත්තු විය යුතු ආකාරයේ, සත්‍ය සඳහා උද්යෝගයත් අවංක කමත් ඔහු මෙම පරීක්ෂනය තුලට ගෙන ආවේ ය. සත්තකින්ම 9/11 කොමිසමේ සමසභාපතිවරයෙකු ලෙස සේවය කිරීම සඳහා කීන්ට තිබුනු විශේෂ සුදුසුකම් අතර, අල්කයිඩාවට හා ඔසාමා බින් ලාඩන්ට ඩොලර් මිලියන ගනන් අරමුදල් සැපයුවේ යයි විශ්වාස කරන සවුදියේ පාලනය යටතේ පවතින ඩෙල්ටා තෙල් සමාගම සමග පැවති ඔහුගේ ම රහසිගත ව්‍යාපාරික ගනු දෙනු තිබුනා විය හැක.

කීන් ඔහුගේ පත්වීම ලබා ගත්තේ කොමිසමේ සභාපති තනතුරට ජනාධිපති බුෂ්ගේ ප්‍රථම තේරීම වූ හෙන්රි කිසිංජර්ට ඉල්ලා අස් වීමට බලකෙරුනු තත්වය තුල පමනක් බව සිහියට නගාගැනීමට වටින්නේ ය. එසේ වූයේ ඔහුගේ පුද්ගලිකත්ව වටාපිටාවේ දුර්ගන්ධය වොෂින්ටනයේ මාධ්‍ය ව්‍යාපාරවල සංවේදීතාවෙන් අඩු නාස්පුඩුවලටත් පවා සැර වැඩිවීම නිසා ය.

9/11 ප්‍රහාරයන්ගෙන් 2500කට වැඩි ජනකායකට සිය ජීවිත අහිමි වූයේ ය යන කාරනය සැලකිල්ලට ගත් විට, ජනතාවගේ නියෝජිතයා බවට අනුමාන කරන කොන්ග්‍රසයට, දිව්රුමක් යටතේ සාක්ෂ්‍ය දීමට කැඳවන සාක්ෂ්‍යකරුවන් සහිත, නිල පරීක්ෂනයක් පැවැත්වීමට පවා නොහැකි වීම එම ආයතනයට ම එරෙහි බරපතල චෝදනාවකි. තවද, අව්‍යාජ පැහැදිලි කිරීමක් ප්‍රතික්ෂේප කල පොලිස් හා ඔත්තු සේවා ආයතනවල, කිසිදු පුද්ගලයෙකුට මොනම ආකාරයකින් හෝ අවම වසයෙන් ආන්ඩුවේ ආරක්ෂාව පිලිබඳ දැවැන්ත අසාර්ථකත්වය වෙනුවෙන් හෝ චෝදනා එල්ල නොකලේ ය.

9/11 පිලිබඳව එකම සැබෑ පරීක්ෂනය වූයේ, ආන්ඩුවෙන් මුලුමනින් ම ස්වාධීනව ද, එහි තොරතුරුවලට පටහැනිව ද, පැට්‍රික් මාටින් විසින් ලියූ වැදගත් විශ්ලේශනයක් ද ඇතුලත් ලෝක සමාජවාදී වෙබ් අඩවිය භාරගත් පරීක්ෂනයයි. සිද්ධීන් පිලිබඳ නිල අනුවාදයේ විකෘතිකරනයත්, අභූත ස්වභාවයත් හෙලිදරව් කෙරෙන පොත් ගනනාවක් තුල එම කාරනය සඳහන් කර තිබේ.

9/11 කොමිසම විසින් සිදු කල වසංකිරීම හෙලිදරව් කෙරෙන කරුනු කිහිපයක් සඳහන් කරන්නේ නම්

*පැහැර ගත් ගුවන් යානා යොදා ගනිමින් ප්‍රහාර එල්ල කිරීමේ හැකියාව පිලිබඳව, ජර්මනිය, ඊජිප්තුව, රුසියාව හා ඊස්රායල් ආන්ඩු එක්සත් ජනපදය වෙත පූර්ව අනතුරු ඇඟවීම් කර තිබීම.

*ගුවන් යානා පැහැර ගැනීමේ අල්කයිඩා සැලසුමක් ගැන අනතුරු අඟවන සීඅයිඒ වාර්තාවක්, ප්‍රහාරයන්ට සති පහකට පෙර එනම් 2001 අගෝස්තු 06 දින ජනාධිපති බුෂ් වෙත ලැබී තිබීම.

*2001 අගෝස්තුවේ දී සකාරියස් මවුසාවි අත්අඩංගුවට ගැනීම, ආන්ඩුවේ තීරනය යටතට පත්වූ විට, ගුවන්යානා පැහැර ගනිමින් හා ඒවා බෝම්බ ලෙස යොදා ගැනීමේ ත්‍රස්තවාදී මෙහෙයුමක් ක්‍රියාත්මක වෙමින් තිබීම පිලිබඳව සැකයට ඉඩක් නොතිබීම. මිනසෝටාහි පෑන් ඇමරිකානු පියාසර ඇකඩමිය, මවුසාවි ගුවන් යානයක් පැහැර ගැනීමට සැලසුම් කරනවා විය හැකියයි සිය කනස්සල්ල එෆ්බීඅයි වෙත දැනුම් දුන්නේ ය.

*කුමන්ත්‍රනයේ නායකයා ලෙස හඳුනා ගෙන ඇති මොහොමඩ් අටා, ඊස්රායල් බෝම්බ සිද්ධියට සම්බන්ධ බව හඳුනාගැනීමෙන් පසු, 1986 පටන් ම ආන්ඩුවේ ත්‍රස්තවාදී සුපරීක්ෂන ලේඛනයට ඇතුලත්ව සිටි අතර 1999 වසර පුරාම ජර්මන් පොලීසියේ සුපරික්ෂාවට ලක්ව සිටියේ ය. 2000 වසරේ ඔහුගේ හැසිරීම එෆ්බීඅයිය නිරීක්ෂනය කර තිබුනි. 2001 ජනවාරියේ දී අටාට, එක්සත් ජනපදයට පිවිසීම සඳහා අවසර ලැබුනේ, ඔහුගේ සංචාරක වීසා බලපත්‍රයේ කොන්දේසි පැහැදිලිවම උල්ලංඝනය කරමින් තමන් ගුවන් යානා පැදවීමේ පාඨමාලාවක් හදාරන බවට ප්‍රකාශයක් ආගමන බලධාරීන් වෙත කර තිබිය දී ය. අටා එක්සත් ජනපදය තුල දී සිය වැඩ කටයුතු අත්‍යසාමාන්‍ය පහසුවකින් කරගෙන ගිය ආකාරය, *The War on Truth* (සත්‍යයේ යුද්ධය) යන සිය කෘතිය තුල නෆීස් මොසාඩෙක් අහමඩ් නමැති ලේඛකයා මනාව කැටිකොට දක්වා ඇත.

"කෙටියෙන් කිවහොත්, බලධාරීන් ඉදිරියේ හොඳින් හෙලිදරව් වී සිටියත් මොහොමඩ් අටා , ගෙනගියේ නිස්කලංක ජීවිතයකි. 1986 පටන් ඔහු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ත්‍රස්තවාදී සුපරීක්ෂන ලේඛනයට ඇතුලත් කොට සිටියත්, එක්සත් ජනපදයට නිදහසේ ඇතුලුවීමටත් පිටව යෑමටත් කිහිප වතාවකදී ම ඔහුට අවසර ලැබී තිබුනි. පුපුරන ද්‍රව්‍ය සෑදීමට යොදාගතහැකි රසායනද්‍රව්‍ය විශාල ප්‍රමානයක් මිලට ගැනීම නිසා 2000 ජනවාරි සිට මැයි දක්වා කාලය තුල ඔහු සීඅයිඒ ඒජන්තයන්ගේ ආවේක්ෂනයට යටත් විය. 2001 ජනවාරියේ දී ඔහු, අයිඑන්එස් ඒජන්තයන් විසින් මියාමි ජාත්‍යන්තර ගුවන්තොටුපලේ දී විනාඩි 57ක් රඳවාගනු ලැබුවේ, මීට පෙර වීසා කාලය ඉක්මවා රැඳීසිටීම නිසා හා ෆ්ලොරිඩාහි ගුවන් යානා පැදවීමේ පාසැලෙහි පුහුනු වීම සඳහා එක්සත් ජනපදයට ඇතුලු වීමේදී පිලිගතහැකි වීසා බලපත්‍රයක් ඉදිරිපත් කිරීමට අසමත් වීම නිසා ය. එහෙත් එය ඔහු නතර කිරීමට සමත් නොවී ය. එක්සත් ජනපදයේ ගුවන් යානා පැදවීමේ පාසැල්වලට ත්‍රස්තවාදීන් ඇතුල් වීමේ හැකියාව

පිලිබඳව කලක් තිස්සේම එෆ්බීඅයියට සැකයක් පැවතියේ වී නමුත්, ෆ්ලොරීඩා හි පියාසර පාසැලකට ඇතුල්වීමට අටා ට ඉඩ ලැබුනි. 2001 අප්‍රේල් මාසයේදී බලපත්‍රයක් නොමැතිව වාහනයක් පැදවීම සම්බන්ධයෙන් පොලීසිය ඔහු රඳවා ගත්තේ ය. ඔහු මැයි මාසයේ දී උසාවියේ පෙනීසිටීමට අසමත් වූ අතර අත්අඩංගුවට ගැනීමේ උසාවි වරෙන්තුවක් නිකුත් කර තිබුනි. එය ද ඔහු නතර කිරීමට සමත් නොවූයේ කිසි විටෙකත් වරෙන්තුව ක්‍රියාත්මක නොකිරීම නිසා ය. එනමුදු බීමත්ව රිය පැදවීම සම්බන්ධයෙන් ඔහු පසුව අවස්ථා දෙකකදී ම අත් අඩංගුවට ගෙන තිබුනි. එක්සත් ජනපදයේ ඔහු ගත කල කාලය තුල අටා කිසි විටෙකත් අන්වර්ථ නාමයකින් කටයුතු කිරීමට උත්සාහ නොකල අතර පාසැලෙහි ඉගෙනීමේදී ද, ගමන් බිමන් යෑමේදී ද, ජීවිතය ගතකිරීමේ දී ද, ඔහු කටයුතු කලේ සිය සැබෑ නමෙන් ය. 2001 සැප්තැම්බරයේ දී එෆ්බීඅයිය සොයා ගත් පරිදි අටා නිති පතා සම්බන්ධකම් පවත්වා ගෙන ගිය පුද්ගලයන් හතලිස් දෙනෙකුගේ විද්‍යුත් තැපැල් ලේඛනයෙහි දැක්වුනු පරිදි ඔවුන් එක්සත් ජනපදයේ ප්‍රධාන ආරක්ෂක කොන්ත්‍රාත් ආයතනවල දැනට සිටින හා හිටපු සේවකයන් වීම ද කුතුහලය දනවයි. ...

"මෙම සිද්ධි දාමය මුදු ලෙස අර්ථනිරූපනය කිරීම දුෂ්කර ය. කෙටියෙන් කිව හොත් විසඳිය නොහැකි නම් නොවැලැක්වියහැකි ලෙස ම එලඹිය හැකි නිගමනය වන්නේ එක්සත් ජනපද ආන්ඩුව දැනුවත්ව හා යලියලිත් හඳුනා ගත් ත්‍රස්තවාදියෙකුට බාධාවකින් තොරව එක්සත් ජනපදයට ඇතුලු වීමටත්, පියාසර පුහුනුවල යෙදීමටත් ඉඩ සැලසූ බවයි." [Oliver Branch press, Northampton, mass 2005. pp 205-06 (ඔලිවර් බ්‍රාන්ච් ප්‍රෙස්, නොතැම්ප්ටන්, මාස් 2005. පිටු 205-206)

*එක්සත් ජනපද ආන්ඩුව වෙතින් අටාට හිමි වූ වීඅයිපී සැලකිලිවලට කිසි සේත් නොදෙවෙනි ලෙස අසාමාන්‍ය අනෙක් කාරනය නම්, 9/11 අනෙකුත් කොල්ලකරුවන් කෙරෙහි පුද කල ආගන්තුක සත්කාරය යි. නවාෆ් අල්හස්මි හා බාලිඩ් අල්මිඩාර් යන දෙදෙන 2000 ජනවාරියේ දී අල්කයිඩාවේ ඊනියා "සමුලු රැස්වීමට" සහභාගි වී ඇති බව සීඅයිඒ විසින් හොඳින් හඳුනා ගෙන තිබුනි. ඔවුන්ගේ හැසිරීම සීඅයිඒ විසින් වසරකට අධික කාලයක් තිස්සේ නිරීක්ෂනය කර තිබුන ද ඉන් එක් අයෙකුට හෝ එක්සත් ජනපදයට ඇතුල්වීමේ දී කිසිදු ගැටලුවක් ඇති නොවී ය. අල්මිඩාර්, 2000 ඔක්තෝබරයේ දී යූඑස්එස් කෝල් යුද නැවට බෝම්බ තැබීමට සම්බන්ධ බවට හඳුනා ගෙන තිබුනත්, ඔහු එක්සත් ජනපදයට පැමිනියේ 2001 ජූනි මස අලුත්කල බහුවිධ වීසා බලපත්‍රයකිනි.

*2001 ජනවාරි 30 දින ඩුබායි ජාත්‍යන්තර ගුවන් තොටුපලට පැමිනි විට, එක්සත් ජනපද ආන්ඩුවේ නිශ්චිත උපදෙස් මත, ප්‍රශ්න කිරීම සඳහා අත්අඩංගුවට ගෙන පැය කිහිපයක් රඳවා ගනු ලැබූ සියාඩ් සමීර් ජරා 9/11 ගුවන් යානා කොල්ලයේ තවත් අනාගත හවුල්කරුවෙකු විය. මෙම පුද්ගලයාගේ කටයුතු පිලිබඳව උනන්දුවීමට තරම් බරපතල හේතු එක්සත් ජනපදය සතුව නොතිබියේ නම් මෙවැන්නක් සිදුවීමට ඉඩක් නැතැයි යමෙකු සිතනු ඇත. මෙම සිදුවීම නොතකා ම අට මසකට පසුව ජරා මහතාට එක්සත් ජනපදයට ඇතුල්වීමටත් පියාසර පුහුනුවට බැඳීමටත් හැකි විය.

දැනටමත් තහවුරු කර ඇති කරුනු මත පදනම්ව, මොහොමඩ් අටා සහ අනෙකුත් ගුවන් කොල්ලකරුවන් 9/11 සඳහා සූදානම් වූයේ එක්සත් ජනපද ආන්ඩුවේ සීඅයිඒ සහ අනෙකුත් ඔත්තු සේවා ඒජන්සිවල බලගතු අයවලුන් විසින් සම්පාදනය කල ආරක්ෂක කුඩය යට බව නිසැක ය. එක්සත් ජනපදය තුල, ඉන් පිටත හා එය වටා සිදු වූ ඔවුන්ගේ නිර්බාධිත වැඩ කටයුතු, රාජ්‍ය අන්තරායනය තුල බලගතු පුද්ගලයන්ගේ ආරක්ෂාව භුක්ති විඳීමෙන් තොරව ක්‍රියාත්මක කල නොහැකි වනු ඇත. එක්සත් ජනපදය තුල ජීවත් වීමේ දී ඔවුන්ගේ කැත හා නොහික්මුනු හැසිරීම පිලිබඳව හෙලිදරව් වූ තොරතුරු අනුව ද, පොලිසියේ අවධානයට යලි යලිත් ලක්වීමට තුඩු දුන් ඔවුන්ගේ නොසැලකිලිමත් භාවයට අනුව ද අටා හා ඔහුගේ සගයන්, ප්‍රධාන කුමන්ත්‍රනකරුවන් වූයේ යයි සැලකීම පවා දුෂ්කර වේ. ඔවුන් කල සෑම දෙයකදී ම ඔවුන්ගේ ත්‍රස්තවාදී අරමුනු පල කෙරෙන සලකුනු විය. එහෙත් ඉහල ම මට්ටමේ "දේව දූතියන්" ඔවුන්ට රැකවරන සැලසූ බව පැහැදිලි ය.

එහෙත් කුමන අරමුනක් සඳහා ද? අටා සහ ඔහුගේ සහචරයන් වෙනුවෙන් මැදිහත් වූවන් ඔවුන් කිසියම් වර්ගයක ත්‍රස්තවාදී ක්‍රියාවක් සැලසුම් කරන බවත්, තවද එවන් ක්‍රියාවක් සිදු කල හොත් එය නිශ්චිත ප්‍රතිපත්තිමය අරමුනුවලට උපකාරී වන්නේ යයි විශ්වාස කල බවත්, නිගමනය කිරීමට විශේෂිත කුමන්ත්‍රනකාරී සිතුවිල්ලක් අවශ්‍ය වන්නේ නැත. එසේ නම් මෙම අරමුනු කවරේ ද?

## ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ගෝලීය මූලෝපාය

මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයීම සඳහා 9/11 සිදුවීම් පුලුල් ඓතිහාසික සන්දර්භයක තැබීම අවශ්‍ය වේ. පසු ගිය පස් වසර තුල එක්සත් ජනපදය අනුගමනය කල ප්‍රතිපත්තීන්ගේ සැබෑ මූලාරම්භය සොයා ගත යුත්තේ, 2001 සැප්තැම්බර් 11 සිදුවීම් තුල නොව, ඊට හරියටම දශකයකට පෙර සිදු වූ සිද්ධියක් එනම්, 1991 දෙසැම්බරයේ දී සෝවියට් සංගමය විධිමත් ලෙස දියකර හැරීම තුල ය. ඇමරිකානු පාලක පැලැන්තියේ පුලුල් කොටස් විසින් සෝවියට් සංගමයේ බිඳ වැටීම අර්ථ දක්වනු ලැබුවේ එක්සත් ජනපදයේ අනභියෝගී

ගෝලීය භූ මූලෝපායික ආධිපත්‍යය පිහිටුවා ලීමේ පෙර නොවූ විරූ අවස්ථාවක් ලෙස ය. සොවියට් සංගමය නොතිබෙන්නට ලෝකයේ කොතැනක හෝ ඇමරිකානු මිලිටරි බලයේ ප්‍රක්ෂේපනය මත සාර්ථක මර්දනයක් යෙදිය නොහැකි වනු ඇත. සැබැවින්ම, ඇමරිකානු පාලක පැලැන්තිය අමු මිලිටරි බලයේ අර්ථයෙන්, එක්සත් ජනපදයේ මුලුමහත් ආධිපත්‍යය, ලෝක ආර්ථිකය තුල රටේ ආර්ථික තත්වයේ දිගුකාලීන පරිහානිය වැලැක්වීමට, යෙදිය හැකි යයි විශ්වාස කලහ.

සෝවියට් සංගමය බිඳ වැටීමේ වඩාත් වැදගත් ප්‍රතිඵල අතුරින් එකක් වූයේ, යුරේසියාවේ දැවැන්ත භූමි ස්කන්ධය තුල ශාරීරික බල තුලනයේ පෙරලිකාරී වෙනස යි. පැරනි සෝවියට් සංගමයේ මධ්‍යම ආසියානු සමූහාන්ඩු, ස්වාධීන රාජ්‍යයන් බවට පරිවර්තනය වීම මත් නිර්මානය කලේ, ප්‍රයෝජනයට ගැනීමට එක්සත් ජනපදය දැඩි ගිජුකමක් දැක්වූ, බලයේ යෝධ රික්තයකි. තවද, එම රික්තය, මැදපෙරදිග තුල ඇමරිකානු බලයේ ආක්‍රමන ශීලී ප්‍රක්ෂේපනයට, මග හෙලි කලේ ය.

ලෝකයේ මූලෝපායික තෙල් හා ගෑස් සංචිතවලින් අතිවිශාල ප්‍රමානයක් මෙම, භූගෝලීයව ඒකාග්‍ර වූ කලාප තුල පිහිටා තිබෙන බව වටහා ගැනීමට ඇමරිකානු ධනේශ්වරය අසමත් නොවී ය. නව මූලෝපායික බාහිර රේඛාවන්, 1990 ගනන් මැද භාගයේ දී මතුවීමට පටන් ගෙන තිබුනි. ජනාධිපති කාටර්ගේ හිටපු ජාතික ආරක්ෂක උපදේශක ස්බිග්නිව් බ්‍රෙසෙන්ස්කි විසින් ලියා 1997 *ෆොරින් එෆෙයාර්ස්* සඟරාවේ සැප්තැම්බර්-ඔක්තෝබර් කලාපයෙහි පල කල ප්‍රබල ලේඛනයක, එක්සත් ජනපදයේ ලෝක තත්වය කෙරෙහි යුරේසියාවේ තීරනාත්මක වැදගත්කම ගෙන හැර දැක්වී යඃ

"යුරේසියාව වනාහි ලෝකයේ අක්ෂගත සුපිරි මහාද්වීපයයි. යුරේසියාව අධිකාරවත් කරන බලය, ලෝක ආර්ථිකයේ ප්‍රධාන නිශ්පාදන කලාප තුනෙන් දෙකක්, එනම්, බටහිර යුරෝපය හා නැගෙනහිර ආසියාව පුරා තීරනාත්මක බලපෑමක් ඇති කරයි. යුරේසියාව තුල අධිකාරය දරන රට නිතැතින්ම පාහේ අප්‍රිකාව හා මැදපෙරදිග ද පාලනය කරන බව සිතියමට නෙත් යොමු කිරීමෙන් තීරනය කල හැක. යුරේසියාව දැන් භූ දේශපාලනික චෙස් ලෑල්ලක් ලෙස ක්‍රියාත්මක වෙද්දී තව දුරටත්, යුරෝපයට එකකුත්, ආසියාවට තවෙකකුත් වසයෙන් දෙබිඩි ප්‍රතිපත්තියක මෝස්තරය සැහෙන්නේ නැත. යුරේසියානු භූමි ස්කන්ධය මත බලය බෙදී යාමට කුමක් සිදුවන්නේ ද යන්න, ඇමරිකාවේ ගෝලීය ප්‍රමුඛත්වයටත්, ඓතිහාසික නීති යුක්ත භාවයටත් තීරනාත්මක වැදගත්කමක් දරා සිටියි....

"බිඳෙනසුලු යුරේසියාවක් තුල ක්ෂනික කර්තව්‍යය වනුයේ, එක් රාජ්‍යයක් හෝ රාජ්‍ය එකතුවක්, එක්සත් ජනපදය නෙරපාදැමීමේ හෝ ක්ෂය කර දැමීමේ හැකියාව අත් කර නොගන්නා බවට වග බලාගැනීම යි."

කෙසේ වුවද බ්‍රෙසෙන්ස්කිටමත් වැටහුනු පරිදි, යුරේසියාව තුල ඇමරිකානු රාජ්‍යාන්තර නායකත්වය පිහිටුවීම බිය දනවන ව්‍යාපෘතියකි. මුලින් *ෆොරීන් එෆෙයාර්ස්* හි පලවූ ලිපියෙන් ගෙන හැර පෑ අදහස් ම තව දුරටත් විස්තාරනය කරමින් *ඔයැ ග්‍රෑන්ඩ් චෙස්බෝඩ්* (මහා චෙස් පෙත) නම් සිය කෘතිය තුල, යුරේසියාව " යෝධ මහාද්වීපය" ක් ලෙස විස්තර කල බ්‍රෙසෙන්ස්කි එය අවනත කර ගැනීමේ දී, ආර්ථිකව වඩාත්ම සාර්ථක හා දේශපාලනිකව සුපිරි ගෝලීය බලවතෙකුට පවා දැරීමට අපහසු තරම් විශාල, එසේ ම ජනාකීර්න, සංස්කෘතිකව විෂම ජාතී හා ඓතිහාසිකව අභිලාෂවත් මෙන්ම දේශපාලනිකව ජව සම්පන්න රාජ්‍යයන්ගෙන් සැදුම් ලත් බව" සඳහන් කරයි. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අධිපතිවාදී අභිප්‍රායන්ට පවතින තවත් බාධකයක් බ්‍රෙසෙන්ස්කි පෙන්වා දෙයි.

"එතෙර දී ආඥාදායක වීමට තරම් ඇමරිකාව, දේශීයව ප්‍රජාතන්ත්‍රවාදී වැඩි ය යන්න ද එක් කාරනයකි. ඇමරිකාව සතු බලය යෙදීම, විශේෂයෙන්ම මිලිටරිමය බියගැන්වීමේ පරිමාව මෙ මගින් සීමා කරයි. ජනතාවාදී ප්‍රජාතන්ත්‍රවාදය, මීට පෙර කවදාවත් ජාත්‍යන්තර ආධිපත්‍යය ලබා ගෙන නැත. *ස්වදේශීය දිවි පැවැත්ම පිලිබඳ මහජන හැඟීමට එල්ල වන හදිසි තර්ජනයක් හෝ අභියෝගයක කොන්දේසි යටතේ හැර,* බලය යොදාගැනීම මහජන ආවේගය පාලනය කරන අරමුනක් නොවේ. ආර්ථික ස්වයං ප්‍රතික්ෂේපය, එනම් ආරක්ෂක වියදම්, මානව පරිත්‍යාග එනම් වෘත්තීය සොල්දාදුවන් අතර පවා ජීවිත හානි, අවශ්‍යතාවක් බවට පත් කරන උත්සාහය, ප්‍රජාතන්ත්‍රවාදී සහජාසයන්ට ආගන්තුක ය. අධිරාජ්‍ය බලමුලුගැන්වීමට ප්‍රජාතන්ත්‍රවාදය සතුරු" ය. [*The Grand Chessboard,* (මහා චෙස් පෙත) මූලික පොත්, පිටු 35-36, අවධාරනය ඇඳිනි].

9/11 සිදුවීම් මගින් හරියටම සපයනු ලැබුවේ "දිවි පැවැත්ම පිලිබඳ මහජන හැඟීමට එල්ල වන හදිසි තර්ජනයක් හෝ අභියෝගයක්" ය. එය අඩුම වසයෙන් කෙටි කාලීනව, ස්වයංආරක්ෂාවේ හා පලිගැනීමේ නාමයෙන්, ඇමරිකානු මිලිටරි බලය මුදාහැරීම සඳහා යුක්තිකරනයක් සම්පාදනය කලේ ය. මෙය එසේ වූ පලියට ම, ලෝක වෙලඳ මධ්‍යස්ථානයට එල්ල වූ ප්‍රහාරය, රාජ්‍යය ඇතුලත ම සිටින අය විසින් සෘජු ලෙස ම සැලසුම්කර ක්‍රියාත්මක කලා යයි සනාථ නොකරයි. එහෙත් බ්‍රෙසෙන්ස්කිගේ විශ්ලේෂනය පෙන්වා දෙන්නේ, එක්සත් ජනපදයේ සුවිශාල භූ-මූලෝපායික අභිලාෂයන් පිලිබඳ ඉහල මට්ටමේ සුපරීක්ෂාකාරිත්වයයි. එහි අත්‍යවශ්‍ය කොටසක් වන රටේ දේශසීමාවන් හි සිට සැතපුම් දහස් ගනනක් ඈත

යුද්ධය ගෙන යාම සඳහා මහජන විඥානයෙහි නාටකාකාර හදිසි වෙනසක් අවශ්‍ය කෙරිනි.

9/11 කුමන්ත්‍රනය සැලසුම් කර, අනුබල දී, ක්‍රියාවට නැගීමේ දී, රාජ්‍යයේ ක්‍රියාකාරිත්වයේ සම්බන්ධය හා සහභාගිත්වයේ පරිමානය කවරක් වුවත්, ගෙවීගිය දශකය මුලුල්ලේ ම විස්තාරනය කෙරී, සම්පූර්නත්වයට පත් කර තිබුනු, මිලිටරිවාදී න්‍යාය පත්‍රයක් දියත් කිරීමේ නිමිත්ත ලෙස එදින සිදුවීම් වහාම වැලඳගත් බව නිසැක ය.

තීරනාත්මක මූලෝපායික අරමුනු සාක්ෂාත් කර ගැනීම, අවසාන හා අත්‍යාවශ්‍ය එල්ලය බවට පත් වූ, මිලිටරි ක්‍රියාවන් නීති යුක්ත කිරීමේ දී, නාටකාකාර සිද්ධීන් ඒ සඳහා යොදාගත් බොහෝ නිදසුන්, එක්සත් ජනපදයේ සමස්ත ඉතිහාසය පුරාම දැකිය හැකි බව, අප අමතක නොකල යුතු ය. පුපුරාගිය මෙවන් සිදු වීම් සෑම විටම මිලිටරි ක්‍රියාවන්ට "හොඳ" හේතුවක් වූවා මිස "සැබෑ" හේතුව නොවී ය.

සිද්ධිය වූවාට පසුව අප පන්ඩිතයන් වී සිටිනවා නොවේ. ලෝක වෙළඳ මධ්‍යස්ථානයට පහර එල්ලවී පැය ගනනාවක් ඇතුලත, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, පැමිනෙනු ඇත්තේ කුමක් දැයි අනතුරු ඇඟවී ය. 2001 සැප්තැම්බර් 12 දින, *ලොසවෙඅ*, ප්‍රහාරය හෙලා දකිමින් ප්‍රකාශ කලේ ""ත්‍රස්තවාදය, එක්සත් ජනපද සංස්ථාපිතය ඇතුලත පාලක පැලැන්තියේ භූ-දේශපාලනික හා ආර්ථික අවශ්‍යතාවන් ඉදිරියට ගෙන යාමේ දී, යුද්ධයට එලඹීම යුක්ති යුක්ත හා සාධාරන කරනය සඳහා, එවන් සිදුවීම් ග්‍රහනය කර ගත්තා වූ අය ගේ අතට ක්‍රීඩාකර ඇතැයි" යනුවෙනි.

සැප්තැම්බර් 14 දින *ලෝසවෙඅ* ප්‍රකාශ කලේ " ලෝක වෙලඳ මධ්‍යස්ථානයට හා පෙන්ටගනයට එල්ල වූ ප්‍රහාර, වසර ගනනාවක් තිස්සේ පාලක පැලැන්තියේ අතිශය දක්ෂිනාංශික කොටස් හඬ නගමින් සිටි, දුරදිග යන න්‍යායපත්‍රයක්, ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවක් ලෙස වැලඳගෙන තිබේ. ප්‍රහාරය සිදු වූ දින ම කුමන්ත්‍රනයේ පරිමාව හෝ ප්‍රහාරයේ මූලය කෙරෙහි යම් එලියක් විහිදෙන්නටත් පෙර, ඇමරිකාව යුද්ධය වෙත අවතීර්න වූ බවටත් ඇමරිකානු ජනතාවට යුද්ධය පැවතීමේ සියලු ප්‍රතිවිපාකයන් පිලිගැනීමට සිදුවන බවත් ප්‍රකාශ කෙරෙන, මනාව සම්බන්ධීකරනය කල ව්‍යාපාරයක්, ආන්ඩුව සහ ජනමාධ්‍ය විසින් දියත් කරන ලදී."

**මතු සම්බන්ධයි**

© www.wsws.org